පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | සතිය-

ශ්‍රේණිය - 9 ශ්‍රේණිය | Prepared by- ඩී. එම් .පි .එස් දිසානායක -ර/වතුපිටිය වි.

01. සිහිනි 9 ශ්‍රේණිය ඉගෙනුම ලබන ශිෂ්‍යාවකි. ඇයගේ අධ්‍යාපන කටයුතු සඳහා පරිගණකයක් අවශ්‍ය වී ඇති අතර පහත සඳහන් පිරිවිතරයන් සහිත පරිගණකයක් මිලදී ගැනීමට ඇය අපේක්ෂා කරයි.

දෘඩ තැටි (Hard disk) - 500 Gb

රැම් ධාරිතාවය (Ram) - 2 Gb

සකසනයේ වේගය (Processor) - 3.0 GHz

පරිගණක අලෙවි ආයතනයෙන් ඇයගේ අවශ්‍යතාවයට ගැළපෙන, ඉහත පිරිවිතරයන් සියල්ල සහිත පරිගණකයක් සොයාගන්නා තෙක් පවතින පරිගණක එකින් එක ඇය පරික්ෂා කර බලයි. එයට අදාළ ගැලීම් සටහන පහත දැක්වේ. ගැලීම් සටහනේ A,B,C,D,E යන හිස් තැන් පිරවීමට සුදුසු වචනය වරහන් තුලින් තෝරා ලියන්න.




( දෘඩ තැටියේ ධාරිතාවය 500 Gb හෝ ඊට වැඩි වේද ?, සකසනය, අවසානය, රැම් ධාරිතාවය 2 Gb හෝ ඊට වැඩි වේද ?, සකසනයේ වේගය 3.0 GHz හෝ ඊට වැඩි වේද ?)

02. සිහිනි ඇයගේ අවශ්‍යතාවයට ගැළපෙන පරිගණකයක් මිලදී ගත් අතර වෙළද ආයතනයෙන් ලබා දුන් බිල්පත පහත දැක්වේ. එය පැතුරුම්පත් මෘදුකාංගක් භාවිතා කොට සකසා තිබුණි.

| | A | B | C | D | E |
|---|---|---|---|---|---|
| 1 | අයිතමය | ඒකක මිල | ප්‍රමාණය | මිල | |
| 2 | System unit | | 1 | 15000.00 | |
| 3 | Key board | | 1 | 800.00 | |
| 4 | Mouse | | 1 | 500.00 | |
| 5 | | | | | |
| 6 | | | | | |
| 7 | | | | | |
| 8 | මුළු එකතුව | | | 16300.00 | |
| 9 | | | | | |

i. සිහිනි මිලදී ගත් භාණ්ඩ වල මුළු එකතුව දැක්වෙන කෝෂයේ කෝෂ ලිපිනය ලියා දක්වන්න.

ii. ඉහත අයිතම වල මිල ගණන් සඳහන් කෝෂ වල කෝෂ පරාසය ලියා දක්වන්න.